*Summaries in Sinhala*
*Intervention 2013, Volume 11, Number 3, Page 362 - 363*

# Summaries in Sinhala

### ADAPT ආකෘතිය: පශ්චාත් යුධ පසුබිමක මානසික සෞඛ්‍ය සහ මනෝසමාජයීය වැඩසටහන් උදෙසා සකසන ලද සංකල්පිත රාමුව

යුධ වාතාවරණයන්ට මුහුණ පෑ මහජනයාට උපකාර කිරීම සඳහා  මානසික සෞඛ්‍ය සහ මනෝසමාජයීය විෂය පථයේ සහ එම සංරචකවල මැදිහත්වීමේ අවශ්‍යතාවය ඒකමතිකව ගොඩනැගෙන කාරණයකි. හිංසනය සහ කම්පනයට පත්වූවන් අනුගත කිරීම සහ සංවර්ධනය කිරීමේ ආකෘතිය, මෙම ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාවන් තහවුරු කරන සංකල්පිත රාමුවක් ලෙස ක්‍රියාකරයි.

**මූලික යෙදුම්:** මානසික සෞඛ්‍ය සහ මනෝසමාජයීය සහයෝගය, සංකල්පිත රාමුව, හිංසනය සහ කම්පනයට පත්වූවන් අනුගත කිරීමේ ADAPT ආකෘතිය

---

### යුධ වාතාවරණයකට පසු මානසික සෞඛ්‍ය සේවය නැවත ගොඩනැගීම. බොස්නියාවේ හෙසගෝවිනාවට ස්විඩනයේ සහයෝගය (1997-2004)

බොස්නියාවේ හෙසගෝවිනාවේ යුධ තත්ත්වයෙන් පසු, ස්වීඩන් ජාතික ප්‍රවීණයන් කණ්ඩායමක් විසින් මනෝ චිකිත්සක සහ ප්‍රජා කටයුතු පුහුණුවක් මානසික සෞඛ්‍යය ගොඩනැගීමේ අරමුණින් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනේ ප්‍රධාන ප්‍රතිපත්ති ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයන් සමග සමීප සහයෝගීතාවක් පවත්වා ගැනීම, පුද්ගලික සබඳතා අඛණ්ඩව පවත්වා ගැනීම, දිගු කාලීන සබඳතා උදෙසා දැනුම හුවමාරුව සඳහන් කළ හැකිය. මෙම වැඩසටහනේ සහයෝගය ඇතිව ප්‍රජා මනෝ සෞඛ්‍ය සංවිධාන ඇතිකිරීමත් ඒ සඳහා මනෝ වෛද්‍යවරයෙක්, හෙදියන් 4 ක්, මනෝ විද්‍යාඥයෙක් සහ සමාජ සේවකයෙක් ඇතුළත් කාර්යය මණ්ඩලයක් ලබා දීම සිදුකෙරිණි. මෙම කාර්ය මණ්ඩලය දිනකට 25-30 ත් අතර සාමාන්‍යයකින් යුතුව රෝගීන් 65000 ක් පරීක්ෂා කරන ලදී. මෙම රෝගීන්ගෙන් 75%ක් මානසික රෝගීන් වූහ. පුහුණු කාර්ය මණ්ඩලය තුළ ප්‍රජා මනෝ චිකිත්සාවට යොමු වීම කෙරෙහි දැඩි මනාපයක් ඇතිවීම විශාල ආකල්පමය වෙනසක් ලෙස දැකිය හැකි විය. මෙම පුහුණුවේ ප්‍රතිඵලයක් ලෙස දේශීය වෘත්තිකයන්ගෙන් සමන්විත අවිධිමත් ජාලයන් පිහිටවීම ඇරඹිණි. ව්‍යාපෘතියෙන් වසර 4කට පසුව පැවැත්වුණු ඇගයීමකදී ,එම ප්‍රදේශයේ මනෝ චිකිත්සක සේවාව වැඩි වශයෙන්ම ලබා දෙන්නන් ලෙස ප්‍රජා මනෝ සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන හඳුනාගෙන තිබේ.

**මූලික යෙදුම්:** බොස්නියා හෙසගොවිනා, පුහුණුව, ප්‍රජා මනෝ චිකිත්සාව, සමාජ සේවා, පශ්චාත් යුධමය තත්ත්වය

---

### විශේෂ අවධානය: සිරියාව

සිරියාවේ මානසික සහ මනෝ සමාජීය සහයෝගය පිළිබඳ ලිපි 6ක් මෙහි ඇතුළත්ය. 2003 සදාම් හුසේන්ගේ ආධිපත්‍යයේ බිඳ වැටීමෙන් පසුව ඇතිවූ සිවිල් යුද්ධයත් සමග ඉරාක සරණාගතයින් දස දහස් ගණනකට ආරක්ෂිත නවාතැන් පොළක් වූයේ අසල්වැසි සිරියාවයි. කෙසේ වෙතත් ලෝකයේ තෙවැනි විශාලතම සරණාගත සත්කාරකයා වූ සිරියාව මෙයට  වසර 2ක් තුළදී ලොව විශාලතම සරණාගතයන් බිහිකරන්නා බවට පත්වී තිබේ. මෙම ලිපිය එම වෙනස පිළිබඳ අවධානය යොමු කරයි. මෙම ඒකකය ආරම්භ වන්නේ කොන්ස්ටක් අවුෂ් , ලියම් එලොල් සහ රාවක් අජ්ලානි විසින් රචිත ලිපියෙනි. ඔවුන් විසින් සිරියාවේ සරණාගතයින් සහ සිවිල් ජනයා ගේ මානසික සෞඛ්‍ය පැතිකඩ අධ්‍යයනය කර, ක්‍රමානුකූලව මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය සහයෝගීතා පසුබිම පිළිබඳව ග්‍රන්ථ විචාරයක් කර ඇත. ඔවුන්ගේ ග්‍රන්ථ විචාරය කාල පරිච්ඡේද 2ක් ආවරණය කරයි. එනම්, 2006 දී ඇතිවුනු සංකීර්ණ සරණාගත හදිසි තත්ත්වය සහ වර්තමාන අවතැන්වීම සහ 2010 දී උගුවූ සංකීර්ණ සරණාගත හදිසි තත්ත්වය වේ.
දෙවැනි ලිපියේ, සිරියාවේ UNHCR හි සේවය කළ කොන්ස්ටන් ඔවුස් මානසික සෞඛ්‍යය හා මනෝසමාජයීය සහයෝගීතාවය උදෙසා ඇරඹූ සුවිශේෂී වැඩසටහන විස්තර කෙරේ. ඉරාක සරණාගතයින් 2006 වසරේ දී සිරියාවට ගලා ඒමේ දී මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම ලිපියේ අරමුණ වන්නේ 1) මූලික දත්ත උපයෝගී කර ගනිමින් දමස්කසයේ සමස්ත මානසික සෞඛ්‍යය සහ මනෝසමාජයීය සහයෝගීතා වැඩසටහන විස්තර කිරීමය. ඩෙරික් සිලෝව් හඳුන්වා දුන් සිද්ධාන්තමය ආකෘතිය මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. සිරියාවේ UNHCR හි සේවයේ යෙදුණු සහ්රා නිර්ගානි දැඩි ලෙස අනතුරට බඳුන් වූ ඉරාක සරණාගතයින්ට සහාය ලබාදීමට ඉරාක සරණාගත කාන්තාවන් යොදාගත් වැඩසටහන පිළිබඳ විස්තර කෙරේ. මෙම කාන්තාවෙන් සෑම මසකම 6000කට අධික සරණාගතයින් සංඛ්‍යාවකට සහාය ලබාදී විශිෂ්ට ප්‍රතිපල පෙන්නුම් කර ඇති අතර, එම දායකත්වය සිය යහජීවනයටද දායක වූ බව ප්‍රකාෂ කර ඇත. ඉරාක ජාතික මනෝවිද්‍යාඥයෙකු වූ මාහා ඉස්මයිල්, සිරියාවට ගොස් ස්වෙච්ඡා සේවයේ යෙදී සිය මනෝසමාජයීය අත්දැකීම් විස්තර කර තිබේ. ඇය සරණාගතයින්ට ස්වෙච්ඡාවෙන් සේවය කළ අතර, සම වයස් කණ්ඩායම්වලට ප්‍රායෝගික කුසලතා ලබාගැනීමට පහසුකම් සලසාදීමද සිදුකළාය. වැඩසටහන් උපදේශකයෙක් ලෙස UNHCR හි සේවය කළ සිරියානු ජාතික මනෝවිද්‍යාඥයෙකු වූ මේ(Z)සා හසාන් ප්‍රජා මනෝසමාජයීය සහයෝගය සහ උපදේශණ මධ්‍යස්ථානවල අවශ්‍යතාව ඉදිරිපත් කර ඇත. ඇ ඇගේ පසුබිම,දිරිගැන්වීම සහ අභියෝගයන් මෙන්ම වත්මන් තත්ත්වයේ බලපෑම පිළිබඳව ආවර්ජනය කර ඇත.



Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.

අවසාන වශයෙන් වර්තමාන සිරියානු අර්බුදය පිලිබඳව අවධානය යොමු කළ විවිධ ආයතන සමග ලියම් ඉලෝල්,කොන්ස්ටන්ස් ඔවුෂ්,රාවන් අජ්ලානි, නයිරා අවෙටිසාන්, මවුටා බරකත, ලිඩියා බරකත්,මොහොමඩ් වලීල් ඉකුම් සහ වික්ටෝරියා ඩීකැප් දැක්විය හැක. සිරියාවේ සරණාගත බලපෑමට ලක් වූ ජනගහනය අත්‍යවශ්‍ය සම්පත් සහ යටිතල ව්‍යුහයන් ලබාදීම පිළිබඳ සිදුකරන ලද විශ්ලේශණාත්මක තොරතුරු ඔවුන්ගේ ලිපිවලින් ලැබී තිබේ. ඔවුන්ගේ ලිපිවල මීට පෙර මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය සහයෝගයෙන් සිරියාවේ සිටින ඉරාක සරණාගතයන්ට දැක්වූ දායකත්වය සහ ඇගයීම් වර්තමාන සිරියානු අර්බුදය විසඳීමේදී පදනම් කරගත හැකි අයුරු සඳහන් වේ.

**මූලික යෙදුම්:** මානසික සෞඛ්‍යය, මනෝසමාජයීය සහයෝගය, සම්බන්ධීකරණය, සරණාගතයින්, රටතුල අවතැන් වූවන්, සිරියාව, ඉරාකය, ස්වෙච්ඡා සේවකයින්, සමාජය වෙත ගොස්, නගරබද සරණාගතයින්

---

**පලස්තීනයේ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීම සහ මානසික වශයෙන් දූඩිව විඩාවට පත්වීම වැළැක්වීම - කාර්යය මණ්ඩල සඳහා සත්කාර වලදී හා සංවිධාන ගොඩනැංවීමේදී "සිහිකල්පනාව" යන සංකල්පය හඳුන්වාදීම පිළිබඳව පෞද්ගලික අත්දැකීම්**

මෙම ලිපිය නැගෙනහිර ජෙරුසෙලමේ සහ බටහිර ඉවුරේ මානුෂීය සහ මානව හිමිකම් පිළිබඳ වැඩකටයුතු වල නිරතවී සිටින වෘත්තිකයින්ට "සිහිකල්පනාව, එනම් පූර්ණ අවධානයෙන් යුතුව කටයුතු කිරීම" පිළිබඳ සංකල්පය හඳුන්වා දීම සඳහා පෞද්ගලිකව ගන්නා ලද උත්සාහයක් සම්බන්ධයෙන් සැකසී ඇත. පුද්ගලයින් සහ සංවිධානයන්හි ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීම සහ දැඩිසේ මානසික වශයෙන් විඩාවට පත්වීම වැළැක්වීම සඳහා සිහිකල්පනාව පදනම් කරගත් මැදිහත්වීම් සිදුකිරීමත් පෞද්ගලික සහ සමාජ පරිනාමනයේදී පවත්නා සම්බන්ධතාව අවධාරණය කිරීමත් මෙහි ඉලක්කය විය. මෙම ක්ෂේත්‍ර වාර්තාව සංරචකයන් තුනකින් සමන්විත ප්‍රවේශයක් පිළිබඳව පැහැදිලි කරනු ලබයි. 1) සිහිකල්පනාව පදනම් කරගත් දූඩිසේ මානසිකව පීඩාවට පත්වීම වැළැක්වීම සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳව ඉගැන්වීම 2) පෞද්ගලිකව මාර්ගෝපදේශ සැපයීම 3) සංවිධාන ගොඩනැංවීමේදී සත්කාර කිරීම සහ ඉගැනීම ඒකාබද්ධ කිරීම. මෙම පර්යේෂණාත්මක ප්‍රවේශය භාවිතා කිරීම තුලින් කතෘවරයා රාජ්‍ය නොවන ආයතන තුල ඉගැනීම සහ සත්කාර කිරීමේ සංස්කෘතියක් පෝෂණය කිරීම ඉලක්ක කරගනී. පෞද්ගලිකත්වය සහ සමාජ සෞඛ්‍ය අතර සහ පෞද්ගලික සහ සමාජ පරිනාමනය අතර අන්තර් සම්බන්ධතාවය අපි විසින් හඳුනාගන්නා අවස්ථාවක ලොව වෙනස් කිරීමට පවත්නාවූ බලවේගයන් දූඩිසේ මානසිකව විඩාවට පත්වීමේ සහ සර්ව අශුභවාදීත්වයට බලපාන හේතූන්ද වෙනස් කිරීම සිදු කරයි.

**මූලික යෙදුම්:** සිහිකල්පනාව, දැඩිසේ විඩාවට පත්වීම, ඔරොත්තු දීමේ හැකියාව, සංවිධාන ගොඩනැංවීම, පලස්තීනය, රාජ්‍ය නොවන සංවිධාන



Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.